ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

කළමනාකරණ අධ්‍යයනවේදී උපාධි පාඨමාලාව - සිව් වන මට්ටම

පැවරුම් පරීක්ෂණය - 2013/2014

සාර්ව ආර්ථික විද්‍යාව -MCU 2207

කාලය : පැය දෙකයි (02)

---

දිනය : 2013.09.29 වේලාව : ප.ව. 2.00 – ප.ව. 4.00

---

උපදෙස් :

- 'අ' කොටසට සහ 'ආ' කොටසින් ප්‍රශ්න දෙකකට (02) පිළිතුරු සපයන්න.
- අපැහැදිලි අත් අකුරුවලින් ලියන ලද පිළිතුරු පත්‍ර සඳහා ලකුණු අඩු විය හැක.

## 'අ' කොටස

1 අ) i) "චක්‍රීය ප්‍රවාහය විදහා දක්වන රූප සටහන, ආර්ථිකයක විවිධ අංශයන්ගේ පවතින ආර්ථික අන්‍යෝන්‍ය සම්බන්ධතාවයන් දැන ගත හැකි ප්‍රයෝජනවත් ක්‍රමවේදයකි"
අංශ දෙකක ආර්ථිකයක චක්‍රීය ප්‍රවාහය දක්වන රූප සටහන කුමක්ද? විස්තර කරන්න. (ලකුණු 04)

ii) ආර්ථිකයක ඉතුරුම් ශ්‍රිතය පහත දී ඇති පරිදි යයි උපකල්පනය කරන්න.

$$S = -40 + 0.2Y_d$$

එයින් පරිභෝජන ශ්‍රිතය ගොඩ නගා ,එම ශ්‍රිතයන් දෙක රූපසටහන් භාවිතා කරමින් විස්තර කරන්න. (ලකුණු 06)

iii) "ආන්තික පරිභෝජන නැඹියාව (M.P.C.) වැඩි අගයක් ගන්නා විට වියදම් සංගුණකයේ අගය අඩු අගයක් ගනී." ඔබ එයට එකඟවේද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv) දළ දේශීය නිෂ්පාදනය (G.D.P.) සහ දළ ජාතික නිෂ්පාදනය (G.N.P.) අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

v) දළ දේශීය නිෂ්පාදනය ගණනය කිරීමේදී භාවිතා කරන ක්‍රම වේදයන් මොනවාද? පැහැදිලි කරන්න. (ලකුණු 06)

(මුළු ලකුණු 24)

ආ) අංශ තුනක ආර්ථිකයක විස්තර පහත දක්වා ඇත. අගයන් රුපියල් බිලියන වලිනි.

$C = 48 + 0.8y_d$ (පරිභෝජනය)

$\overline{I} = 40$ (ආයෝජන)

$\overline{G} = 38$ (රජයේ වියදම්)

$\overline{T} = 10$ (ස්වායත්ත බදු)

i) සමතුලිත අවස්ථාවේ ජාතික ආදායම ගණනය කරන්න.

ii) වියදම් සංගුණකය සහ බදු සංගුණකය ගණනය කරන්න.

ස්වායත්ත බදු වලට අමතරව රජය විසින් 10% ආදායම් බද්දක් සහ සංක්‍රාම වියදම් රු. බිලියන 5 ක් $(\overline{TR} = 5)$ හඳුන්වා දුන්නේ නම්;

iii) නව සමතුලිත අවස්ථාවේ ජාතික ආදායම ගණනය කරන්න.

iv) වියදම්, බදු සහ සංක්‍රාම වියදම් සංගුණකයන් ගණනය කරන්න.

රජය ආර්ථිකය විවෘත කර පහත සඳහන් වෙනස්කම් සිදු වූයේ යයි උපකල්පනය කරන්න.

$\overline{X} = 48$ (අපනයන)

$M = 50 + 0.2y$ (ආනයන)

v) නව සමතුලිත අවස්ථාවේ ජාතික ආදායම ගණනය කරන්න.

vi) වියදම්, බදු සහ සංක්‍රාම වියදම් සංගුණකයන් ගණනය කරන්න.

vii) දේශීය මුදලේ වටිනාකම අවප්‍රමාණය වී, ස්වායත්ත අපනයනයන් රුපියල් බිලියන 6 කින්ද, ස්වායත්ත ආනයනයන් රුපියල් බිලියන 2කින්ද, වෙනස් වූයේ නම්, සමතුලිත අවස්ථාවේ ජාතික ආදායම ගණනය කරන්න.

(ලකුණු 24)

ඇ) රටක ජාතික ආදායම් ගණනය කිරීමේදී පවතින සීමාවන් කවරේද?
ශ්‍රී ලංකා ආර්ථිකය උදාහරණයට ගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 60)

## 'ආ' කොටස

2 අ) " සූක්ෂ්ම ආර්ථික විද්‍යාව ආර්ථිකය තුළ පවතින එක් එක් වෙළඳපලවල් කෙරෙහි අවධාරණයක් දක්වන අතර, සාර්ව ආර්ථික විද්‍යාව සමස්ථ ආර්ථිකය පිළිබඳ අධ්‍යයනය කෙරෙහි අවධාරනය කරයි." උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ) i) "ආර්ථිකයක ක්‍රියාකාරිත්වය ගැන යමක් හුවා දැක්වීම සාර්ව ආර්ථික විද්‍යාව ප්‍රයෝජනවත් වීමට එක හේතුවක් වේ. "

උදාහරණ භාවිතා කරමින්, කළමනාකරුවෙකුට ආර්ථික තත්ත්වය/ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුම ඵලදායි ව්‍යාපාර තීරණ ගැනීමට උපයෝගී වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 12)

3 “රජයක් ප්‍රතිපත්ති මිශ්‍රණය කාර්යක්ෂම ලෙස භාවිතා කරමින් රටක සාර්ව ආර්ථිකය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම වැදගත් වේ.” ශ්‍රී ලාංකීය ආර්ථිකය උදාහරණ ලෙස ගනිමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

4 අ) IS/LM ආකෘතිය භාවිතා කරමින් පහත සඳහන් වෙනස්වීම් රටක පොළී අනුපාත සහ සමස්ථ ආදායම් තත්ත්වයට බලපාන ආකාරය විස්තර කරන්න.

i බදු වැඩි කිරීම

ii වාණිජ බැංකු වල සංචිත අනුපාතය අඩු කිරීම

iii අන්තර් බැංකු පොළී අනුපාතය වැඩි කිරීම

iv රජයේ වියදම් අඩු කිරීම

(ලකුණු 10)

ආ) i) අර්ධ තෙරපුම් ප්‍රතිවිපාක යනු කුමක්ද? රූපසටහන් භාවිතා කරමින් විස්තර කරන්න.

ii) ද්‍රවශීලතා උගුල තත්වය යටතෙහි ඵලදායි ප්‍රතිපත්ති කවරේද? විස්තර කරන්න.

(ලකුණු 10)

- හිමිකම් ඇවිරිණි -